www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුරුම සංචාරය ඉන්දියාවේ "පෙරදිග බැලීමේ" මූලෝපාය ඉස්මතු කර දක්වයි

## Burma visit highlights India's "Look East" strategy

**සරත් කුමාර විසිනි**

**2005 අප්‍රේල් 6**

සබඳතාවන් වඩාත් සමීප කර ගැනීම පිලිබඳව බුරුම මිලිටරි ජුන්ටාව සමග සාකච්ඡා කිරීමට ඉන්දීය විදේශ ඇමති නට්වාර් සිං මාර්තු මස අවසාන භාගයේ බුරුමයට දින 4ක සංචාරයක් කලේ ය. මෙය ප්‍රධාන පෙලේ ඉන්දීය දේශපාලනඥයෙක් කල පලමු සංචාරය නොවන අතර එතරම් මාධ්‍ය ආවරනයක්ද නො වී ය. නමුත් එය නව දිල්ලි මූලෝපායේ අර්ථභාරී අංගයක් ඉස්මතු කර දක්වයි. ,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තිය - එනම් ගිනිකොන දිග ආසියාව දෙසට ආර්ථික හා මූලෝපායික දිශානතියක් වර්ධනය කර ගැනීම.

මෙහිදී සිං බුරුම විදේශ ඇමති නයාන් වින් මෙන්ම අගමැති ලුතිනන් ජෙනරාල් සෝ වින් හා පාලක රාජ්‍ය සාම හා සංවර්ධන කවුන්සිලයේ සභාපති තාන් ස්වේ ද ඇතුලත් අනෙකුත් ජ්‍යෙෂ්ඨ පුද්ගලයන්ද හමු විය. ඉන්දීය නිලධාරීන්ට අනුව, ආර්ථික හා ආරක්ෂාව සම්බන්ධ කරුනු ගනනාවක් සාකච්ඡාවට ගනු ලැබී ය. දිල්ලියේ පැවතීමට නියමිත තවත් අමාත්‍ය මට්ටමේ රැස්වීමකදී වෙලඳාම වැඩි දියුනු කිරීම හා දෙරට අතර මාර්ග හා දුම්රිය සබඳතා වර්ධනය කිරීම පිලිබඳව සාකච්ඡා කිරීමට එකඟ විය.

රැන්ගුන්හි දී කතා කල සිං ඉන්දියාවට බුරුමය සමග ,දීර්ග කාලීන සබඳතාවක්, අවශ්‍ය වී යයි ප්‍රකාශ කලේ ය. වර්තමාන ද්විපාර්ශ්වික වෙලඳාම ඩොලර් බිලියන 1ක් වන අතර එය දෙගුන කිරීමේ අපේක්ෂාවෙන් ආන්ඩු දෙක පසුවෙති. විදුලි සංදේශ ව්‍යාපෘති දෙකක් සඳහා බුරුමයට ඩොලර් මිලියන 7ක නයක් දැනටමත් ප්‍රකාශ කර ඇති ඉන්දියාව තොරතුරු තාක්ෂනයට සම්බන්ධ වෙලඳාම සඳහා ඩොලර් මිලියන 3 ක දීමනාවක් නිවේදනය කලාය. ඉන්දියානු සමාගම් බුරුමය තුල තෙල් හා ගෑස් ගවේශනයේ නිරත වී සිටිති.

ඉන්දියාව හා බුරුමය අතර වර්ධනය වන සබඳතා සාපේක්ෂ වශයෙන් මෑත කාලීන ප්‍රපංචයකි. ජුන්ටාව ද එය විසින් 1988 දී ශිෂ්‍යයන්ගේ නායකත්වයෙන් දියත් වූ විරෝධතා සාහසික ලෙස මර්දනය කිරීම ද පිලිබඳව විවේචනශීලී වූ පෙර පැවති කොංග්‍රසය මගින් නායකත්වය දෙනු ලැබූ ඉන්දීය ආන්ඩු අවුන් සාන් සුකී විසින් නායකත්වය දෙන විපක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (එන්එල්ඩී) වෙත සහයෝගය දැක්වූහ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිකයන්ට පලායාම සඳහා සරනාගත රැකවරන හා මූල්‍ය සහයෝගය සම්පාදනය කල ඉන්දියාව 1995 දී සුකී ට අන්තර්ජාතික අවබෝධතා පිලිබඳ ජවහර්ලාල් නේරු සම්මානයකින් පුදනු ලැබී ය.

බුරුම ජුන්ටාව පිලිබඳ ඉන්දියාවේ ආකල්පයේ වෙනසක් 1990 ගනන් මැද භාගයේ සිට සිදු වූ අතර අගමැති අතල් බිහාරි වාජ්පායිගේ භාරතීය ජනතා පක්ෂ (බීජේපී) ආන්ඩුව යටතේ එය වඩාත් වැඩි දියුනු විය. නව දිල්ලිය තම විවේචන පසෙක තැබීමට පටන් ගත්තේ ය. පසුගිය වසරේ බීජේපීයේ පරාජයේ පටන් නව කොංග්‍රස් රජය බුරුමය සමඟ සබඳතා වැඩි දියුනු කර ගෙන ඇත. බුරුම ජුන්ටා නායක තාන් ස්වේ පසුගිය ඔක්තෝබරයේදී ඉන්දියාවට පැමිනි විට රතු පලසක් එලා ඔහුව පිලිගනු ලැබී ය. තාන් ස්වේ පසුගිය වසර 24 තුල ඉන්දියාවට පැමිනි ප්‍රථම බුරුම රාජ්‍ය ප්‍රධානියා ය. තාන් ස්වේ ගේ පැමිනීමට පෙර නව දිල්ලියේ පැවැත්වීමට ගිය බුරුම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිකයන්ගේ සමුලුවක් අත් හිටුවීමට උත්සාහ දැරූ ඉන්දියාව සම්මේලනයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙකුට වීසා ලබා දීම ප්‍රතික්ෂේප කලා ය.

බුරුම ජෙනරාල්වරුන් සතුටු කිරීමට ඉන්දියාව දරන උත්සාහය කරුනු කිහිපයක් මත පදනම් වේ. ඉන්දියාව, බුරුම ගෑස් හා තෙල්වලට ප්‍රවේශය ලබාගැනීමට උද්යෝගී වනවා පමනක් නොවේ, එහි පුලුල් ,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තියේ අත්‍යවශ්‍ය සංරචකයක් වන්නේ බුරුමය හරහා ගිනිකොන දිග ආසියාවට ගොඩබිම් මාර්ගයක් සාදා ගැනීමයි.

තෙල් හා ගෑස් සඳහා ඉන්දියාවේ ඉල්ලුම වේගයෙන් වැඩි දියුනු වන අතර බුරුමය විභවාත්මක මූලාශ්‍රයක් වේ. බුරුම මුහුදේ ගෑස් නිධිවල සිට බංග්ලාදේශය

හරහා ඉන්දියාවට නල මාර්ගයක් ඉදිකිරීම සඳහා ජනවාරි මාසයේ බුරුමය හා බංග්ලාදේශය සමග ප්‍රතිපත්තිමය ගිවිසුමකට ඉන්දියාව එළඹියා ය. වාර්ෂික නල මාර්ග ගාස්තුව වන ඩොලර් මිලියන 125ට අමතරව ඉන්දියානු භූමිය හරහා නේපාලයට සහ භූතානයට ප්‍රවාහන අයිතීන් බංග්ලාදේශය ඉල්ලා සිටන තතු තුල නල මාර්ග කටයුත්ත තවමත් තහවුරුව නැත.

ඉන්දියාවේ ඊසාන දිග ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන විවිධ ආයුධ සන්නද්ධ බෙදුම්වාදී ව්‍යාපාර මර්දනය කිරීමට ද ඉන්දියාව බුරුමයේ සහාය ලබාගෙන ඇත. මෙම කන්ඩායම් ගනනාවක් රැකවරන ලබන්නේ ඉන්දියාව සමග කිලෝමීටර 1640 ක පොදු දේශ සීමාවකට හිමිකම් කියන බුරුමය තුලයි. කැරලිකරුවන් දඩයම් කිරීම සඳහා පසුගිය නොවැම්බරයේදී ඉන්දියානු මිලිටරිය උතුරු මනිපූර් ප්‍රාන්තයේ භටයන් 6000 ක් සහිතව ප්‍රධාන ක්‍රියාන්විතයක් දියත් කලේ ය. බුරුම මිලිටරිය කිසිදු පැනයාමක් වැලැක්වීම සඳහා දේශසීමාව වසා තැබී ය.

විවිධ කන්ඩායම් සමග සම්මුතියකට එළඹීමට හෝ ඒවා තලා දැමීමට නව දිල්ලියට අවශ්‍ය වන කරුනුවලින් එකක් වන්නේ ඊසාන දිග ප්‍රදේශය තෙල්, ගෑස් හා ගල් අඟුරු අතුලත් ඛනිජ ගවේෂනයට විවෘත කරලීමයි. ඇසෑම් ප්‍රාන්තය වත්මන් ඉන්දීය තෙල් අවශ්‍යතාවෙන් සියයට 15 ක් නිපදවයි. මෑතකදී ඊසාන දිග ඇසෑමයේ නව ගෑස් නිධි සොයා ගනු ලැබ ඇති අතර අනෙකුත් ඒවා යාබද අරුනාචල් ප්‍රාන්තයේ සමීක්ෂන මට්ටමේ පවතී.

තවද බුරුමය, ඉන්දියාව හා චීනය අතරවන ප්‍රතිමල්ලභාවයේ රංග භූමියකි. පසුව කී දෙරටම කලාපය තුල වඩාත් ආධිපත්‍යධාරී භූමිකාවක් ඉටු කිරීමේ අභිමතාර්ථයෙන් පසුවෙති. 1988 පසුව බුරුම ජුන්ටාව විවේචනය කිරීමේදී හා එය මත සම්බාධක පැනවීමේදී ඉන්දියාව අනෙකුත් රටවල් හා එක්වූ අතර චීනය බොහෝ කාලයක සිට පැවතෙන තම සබඳතා ශක්තිමත් කර ගෙන ජුන්ටාවේ ප්‍රධාන ආර්ථික, දේශපාලනික හා මිලිටරි සහායකයා බවට පත්විය. මූල්‍යමය ආධාර හා ආර්ථික ආයෝජන සම්පාදනය කල බීජිං පාලනය බුරුම සන්නද්ධ හමුදාවලට නවීකරනය වීමටත් 180,000 සිට 450,000 දක්වා ප්‍රසාරනය වීමටත් උදවු කලේ ය.

චීනය සම්බන්ධයෙන් ගත් කල එයට එක්සත් ජනපදය හා එහි සහායකයන් විසින් තමන් වටලෑම වැලැක්වීමට හා මැදපෙරදිග තෙල් සම්පාදකයන් වෙත වැදගත් නාවික මාර්ග රැක ගැනීමට පවතින මූලෝපායේ වැදගත් සංරචකයකි, බුරුමය. නව දිල්ලිය පිලිබඳව සලකන කල බුරුමය තුල චීනයේ බලපෑම බෙංගාල බොක්ක තුල ඉන්දීය නාවික ආධිපත්‍ය සඳහා වන සැලසුම්වලට තර්ජනයක් වන අතර ගිනිකොන දිග ආසියා කලාපය තුල ආර්ථික හා මූලෝපායික බලපෑම සඳහා වන ප්‍රධාන අභිලාෂයන්ට බාධකයකි.

## ඉන්දියාවේ ,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තිය

1992 දී ප්‍රථමයෙන් ප්‍රකාශයට පත් කල ඉන්දියාවේ ,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තියේ සම්භවය තිබුනේ සෝවියට් සංගමයේ බිඳ වැටීමත් සමග සිදු වූ සීතල යුද්ධයේ අවසානය තුලයි. තමන් පදනම් වී සිටි සෝවියට් සංගමයේ ආර්ථික හා දේශපාලනික සහයෝගය අහිමි වූ ඉන්දීය ආන්ඩුව තම රට තුල නිදහස් වෙලඳපොල ප්‍රතිව්‍යුහගතකරනය ආරම්භ කල අතර විදේශයන් තුල නව වෙලඳපොලවල් හා ආර්ථික සහායකයන් සෙවී ය. එක්සත් ජනපදය විසින් 1990-91 සමයේ මෙහෙය වූ ඉරාකයට එරෙහි ගල්ෆ් යුද්ධය, මැද පෙරදිග කලාපය අස්ථාවර කල තතු තුල ඉන්දියාව විකල්ප බලශක්ති මූලාශ්‍ර සෙවීම ද ඇරඹී ය.

,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තිය ඉලක්ක කරනු ලැබූයේ ගිනිකොන දිග ආසියානු ඊනියා ආර්ථික ,ව්‍යාඝ්‍රයින්, සමග සමීප සබඳතා වර්ධනය කර ගැනීමටයි. 1997 දී ඉන්දියාව කලාපයේ ප්‍රධාන කන්ඩායමේ - ගිනිකොන දිග ආසියානු ජාතීන්ගේ සංගමය (ආසියාන්) - පූර්න සංවාදී සහකරුවකු බවට පත්විය. ,ව්‍යාඝ්‍ර, ආර්ථිකයන් මත ආසියානු මූල්‍ය අර්බුදයේ බලපෑම තිබුනේ වී නමුත්, 1998දී බිජේපී නායකත්වයෙන් යුත් ආන්ඩුව නව දිල්ලියේ බලයට පත්වීමෙන් පසුව ආසියාන් සංවිධානය වෙත වූ දිශානතිය දිගට ම පවත්වා ගෙන ගියේ ය.

2003 ඔක්තෝබරයේ බාලිහි දී පැවති ආසියාන් සමුලුවේ දී ගුවන් හා මාර්ග සබඳතා ද ඇතුලත් ආර්ථික සහයෝගිතාවයන් පිලිබඳ නව ආරම්භකත්වයන් ගනනාවක් අගමැති වාජ්පායි ඉදිරිපත් කලේ ය. සමීප සබඳතා ප්‍රදර්ශනය කිරීම සඳහා ගිනිකොන දිග ආසියාවේ සිට බුරුමය හරහා ඉන්දියාවට ඉන්දීය-ආසියාන් මෝටර් රථ රැලියක් පැවැත්වීමට ඔහු යෝජනා කලේ ය. කලාපයේ රටවල් සමග නිදහස් වෙලඳ ගිවිසුම් වැඩ සටහනක් පිලිබඳව සාරාංශයක් ඔහු ඉදිරිපත් කලේ ය. භාන්ඩ පරාසයක් මත බදු කැපීමේ ගිවිසුමක් තායිලන්තය සමග අත්සන් කල ඉන්දීය අගමැතිවරයා බුද්ධි තොරතුරු හා මිලිටරි සහයෝගය සම්බන්ධව සමීපව වැඩ කිරීමට ඉදිරිපත් විය.

සමුලුවට පූර්වයෙන් වාජ්පායිගේ විදේශ ඇමති යස්වත් සිං, හාවඩ් විශ්ව විද්‍යාලයේදී තම මූලෝපාය

පිලිබඳව සඳහන් කලේ ය. ,ගිනිකොන දිග හා නැගෙනහිර ආසියාව ද ඇතුලත් ආසියාවේ බොහෝ ප්‍රදේශ සමග ඉන්දියාවේ නියුක්තවීම අතීතයේදී ගොඩනංවනු ලැබූයේ විජිතවාදයේ හා සංස්කෘතික බැඳීම්වල පොදු අත්දැකීම් මත පදනම්ව ආසියානු සහෝදරත්වය පිලිබඳව පරමාදර්ශී සංකල්පයක් මත පදනම්ව ය. අද දින කලාපයේ රිද්මය නීර්නය කරනු ලබන්නේ ඉතිහාසය හා සංස්කෘතිය මෙන්ම වෙලඳාම, ආයෝජනය හා නිෂ්පාදනය විසිනි. අපගේ දශක ගනනක් පැරනි 'පෙරදිග බැලීමේ. ප්‍රතිපත්තිය අභිප්‍රේරනය කරනු ලබන්නේ එය විසිනි.,

මෙම කතාව පවත්වනු ලැබුවේ එක්සත් ජනපදයේදී ය යන කරුන අර්ථභාරී ය. වාජ්පායි ආන්ඩුව යටතේ ඉන්දියාව වොෂින්ටනය සමග සමීප ආර්ථික හා මූලෝපායික සබඳතා වර්ධනය කර ගත්තා ය. ඊනියා නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය තුල ඉන්දියාව නායක භූමිකාවක් ඉටු කල සීතල යුධ කාලයේ පැවති අධිරාජ්‍ය විරෝධී පූර්වානම් කරා ආපසු යාමක් නොමැති බවට දුරදිග යන සහතිකයකි සිංගේ මත පල කිරීම්. ගිනිකොන දිග ආසියාව සමග සමීප සබඳතා වර්ධනය කර ගැනීම පිලිබඳ තම අරමුනු ක්‍රියාවෙහි යොදවන තතු තුල ඉන්දියාව පැහැදිලිව ම චීන-ආසියන් සබඳතා ඇහිරවීමේ මං සොයමින් සිටින වොෂින්ටනයේ පිටුබලය සෙවී ය.

පසුගිය වසරේ මැතිවරනයේදී බීජේපීය පරාජය කිරීමෙන් පසුව කොංග්‍රසය නායකත්වය දෙන ආන්ඩුව පූර්ව ප්‍රතිපත්තිවලින් තියුනු බිඳීමක් ගෙන නැත. පසුගිය ඔක්තෝබරයේදී නව දිල්ලියේ පැවති ඉන්දීය-ආසියාන් ව්‍යාපාරික සමුලුවේදී නව විදේශ ඇමති නට්වාර් සිං කීවේ ,පෙරදිග බැලීම, ,දේශපාලන සටන් පාඨයකට හා විදේශ පිලිවෙත් දිශානතියකට වැඩි දෙයක්, වූ බවයි. ඊට පසු මාසයේ පැවති ආසියානු රැස්වීමේදී පුලුල් ,ආසියානු ආර්ථික ප්‍රජාවක්, පිලිබඳ හැකියාවක් ගවේෂනය කිරීමක් පිලිබඳව උද්යෝගයෙන් යෝජනා කල ඔහු, සාම වර්ධනය හා පොදු සමෘද්ධිය පිලිබඳ ආසියාන්-ඉන්දීය සහයෝගය සඳහා වන ගිවිසුමක් අත්සන් තැබී ය.

නව දිල්ලිය බලාපොරොත්තුවන වාසියෙන් කොටසක් ආර්ථිකමය වේ. බොහෝ ආසියානු රටවල් සමග ඉන්දියාවට වෙලඳ ගිවිසුම් ඇත. වර්තමානයේදී මෙම කලාපය ඩොලර් බිලියන 13ක් හෙවත් ඉන්දියාවේ සමස්ත විදේශ වෙලඳාමෙන් සියයට 10කට පමන වග කියයි. තනි වෙලඳපොලක් සඳහා වන ආසියානු සැලසුම්වල වාසිය ගැනීමට හා 2007 වන විට ඩොලර් බිලියන 30 දක්වා කලාපය සමග වන තම වෙලඳාම තුන් ගුනයක් කර ගැනීමට නව දිල්ලිය බලාපොරොත්තු වේ.

නමුත් ඉන්දියාව චීනයෙන් එල්ලවන තරඟයට මුහුන දේ. චීනය ආසියාන් සමග තමන්ගේම වෙලඳ ගනුදෙනුව සාකච්ඡා කරමින් සිටී. එම වෙලඳ ගනුදෙනුව 2005 වසරේ මැද භාගයෙන් ආරම්භව ගතවන ඉදිරි පස් වසර සඳහා බදු කපා හරිනු ඇත. ඉන්දියාවේ පලවන ෆ්‍රන්ට්ලයින් සඟරාවේ මෑතදී පලවූ ලිපියක් අවධානයට ලක් කලේ, ඉන්දියාව ආසියාන් සමග තම සබඳතාවය වර්ධනය කර ගෙන ඇති නමුත් එය දැනට ඩොලර් බිලියන 5 කට ආසන්න වන අතර 2005 දී ඩොලර් බිලියන 100 ක් දක්වා ඉලක්ක කරගෙන ඇති චීනයේ සබඳතා සමග ,සසඳන විට මධ්‍යස්ථ බවයි

ඉන්දියාව ගිනිකොන දිග ආසියාව සමග මූලෝපායික සබඳතා පිලිබඳව ද සැලකිල්ලෙන් පසු වේ. පසුගිය අප්‍රේල් මාසයේ නිකුත් කල නාවික ධර්මතා ප්‍රකාශනයේදී ඉන්දීය නාවික හමුදාව තම ධර්මතාවය, ප්‍රතිමල්ලව පකිස්ථානයෙන් රටේ වෙරලතීරය ආරක්ෂා කර ගැනීමේ සිට, පර්සියානු ගල්ෆ් කලාපයේ සිට මලක්කා සමුද්‍ර සන්ධිය දක්වා වන සමස්ත ඉන්දියන් සාගර කලාපය තම ,සැලකිල්ලට ලක්වන උරුම ප්‍රදේශය, යයි ප්‍රකාශ කිරීම දක්වා වෙනස් කලේ ය. මෙම මූලෝපායේ කොටසක් ලෙස න්‍යෂ්ටික සබ්මැරීන, ගුවන් යානා ගෙන යන අද්මිරල් ගෝෂ්කොව් හා මිග් 29 ණ ගොඩබිම් ප්‍රහාරරප්‍රතිග්‍රාහක ගුවන්යානා 16ක් අයත් කර ගැනීමේ ක්‍රියාවලියේ ඉන්දියාව නිරතව සිටී.

ඉන්දියන් සාගරය හරහා යන අන්තර්ජාතික මුහුදු මාර්ග රැකවල් කිරීමේ දී ප්‍රධාන භූමිකාවක් ඉන්දියාවට අවශ්‍යය. දැනටමත් නව දිල්ලිය, මැලේසියාව හා ඉන්දුනීසියාව සමග මූලෝපායික මලක්කා සමුද්‍ර සන්ධියේ බටහිර අන්තයේ නාවික මුර සංචාර පිලිබඳ ගිවිසුම් සකස් කෙරී ඇත. ඉන්දීය ආන්ඩුව කලාපය තුල තම නාවික හස්තය විහිදීමට දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනය ගසා කෑවාය. තම විශාලතම යුද නොවන ක්‍රියාන්විතයේ යෙදෙන ඉන්දීය නාවික හමුදාව ශ්‍රී ලංකාවට, මාලදිවයිනට හා ඉන්දුනීසියාවට ආහාර, බෙහෙත් හා අනෙකුත් සහන සේවා බෙදා හැරීම සඳහා නැව් 32ක්, හෙලිකොප්ටර් 22ක්, ගුවන්යානා 8ක් හා භටයින් 8,300 ක් යැවී ය.

ගිනිකොන දිග ආසියානු කලාපය තුල තම බලපෑම සඳහා චීනයෙන් එල්ලවන තරඟයට ඉන්දියාව මුහුනදෙන නමුත් එහි ,පෙරදිග බැලීමේ, ප්‍රතිපත්තියට ප්‍රධාන විභවාත්මක බාධාව වන්නේ බීජිනය නොව වොෂින්ටනයයි. තම නව දිල්ලි සංචාරයේදී පකිස්තානය හරහා ඉරානයේ සිට ඉන්දියාවට ගෙන ඒමට සැලසුම් කර තිබූ ගෑස් නල මාර්ගයට විරුද්ධවෙමින් එක්සත් ජනපද රාජ්‍ය ලේකම්

කොන්ඩලීසා රයිස් තම ඉන්දියානු සගයන්ට එක්සත් ජනපද රාජ්‍ය තාන්ත්‍රිකත්වය පිලිබඳව ගොරෝසු පාඩමක් කියා දුන්නා ය. ගිනිකොන දිග ආසියාව හා අනෙකුත් කලාප තුල ඉන්දියානු හා එක්සත් ජනපද අවශ්‍යතා වර්තමානයේදී සමපාත විය හැකි නමුත් ලෝකාධිපත්‍යය සඳහා වොෂින්ටනයේ ආක්‍රමනකාරී ධාවනය අනාගතයේදී අනෙකුත් ඉන්දීය සැලසුම්වලට හරහට නො සිටී යයි සහතිකයක් නොමැත.

ඉන්දියාව වොෂින්ටනය සමග වන තම බැඳීම් ශක්තිමත් කර ගෙන ඇති අතර තම අවශ්‍යතාවලට එක්සත් ජනපද මිලිටරිවාදයෙන් මතු කරන අන්තරායන් පිලිබඳව ඉන්දීය පාලක කොටස් ගැඹුරින් ම සැලකිලිමත් ය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආසියාව තුල ප්‍රාදේශීය බලපෑම සඳහා තරඟ කරන නව දිල්ලිය හා බීජිං, වොෂින්ටනයේ ආක්‍රමනශීලී ප්‍රතිපත්ති පිලිබඳව අන්‍යොන්‍ය බියක් විසින් එකට ආකර්ෂනය කරනු ලබති. අර්ථභාරී ලෙස නිදහස් වෙලඳ ගිවිසුමක් ද ඇතුලත් කරුනු මාලාවක් පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා චීන අගමැති වෙන් ජියාබාඕ මෙම සතියේ ඉන්දියාවට සංචාරය කිරීමට නියමිත ය.

© www.wsws.org